පූනාකරි ප්‍රාදේශීය සභාව - 2023

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පූනාකරි ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පූනාකරි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාල ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඉදිකිරීම් අවසන් කළ ගොඩනැගිලි 04ක පිරිවැය එකතුව රු.2,475,228ක් ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් කාර්යයන් අවසන් නොවූ ගොඩනැගිලි 04ක ඇස්තමේන්තුගත පිරිවැය රු. 3,749,994ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගෙවීම්වලට අදාල බිල්පත් ඉදිරිපත් කළ විගස මෙම ශේෂ නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.10,938,659කට මිලදී ගත් ගෘහභාණ්ඩ 11ක් සහ පරිගනක 23ක පිරිවැය පිරියත හා යන්ත්‍රෝපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) | මෝටර් රථ 03ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.14,250,000කින් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ලැබූ අත්තිකාරම් රු.1,522,075ක් අත්තිකාරම් ගිණුමේ නිරවුල් කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | වටිනාකමරු. 283,835ක් වටිනා අායුර්ෙවද බෙහෙත් ද්‍රව්‍ය 40ක් සහ රු. 199,129ක් වූ සේවක ඇප තැන්පතු 25ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වැය විෂයයන් 02ක 2023 දෙසැම්බර් 31 දිනට ලෙජර ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල | නිවැරදි කිරීමට පියවර ගෙන ඇති බව. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් අදාල මූලික |

| | | | |
|---|---|---|---|
| ශේෂයන් අතර එකතුව රු.1,102,260ක වෙනසක් පැවැතුණි. | | | ලියවිලි සමග සැසඳීමට පියවර ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | එකතුව රු.227,252ක්වූ වර්ෂ 02කට වඩා පැරණි කල්ඉකුත් වූ ඇප තැන්පතු 02ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරි පියවර ගනිමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගත යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,463,227ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,279,869 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම රු.** | **බිල්කළ ආදායම රු.** | **රැස්කළ ආදායම රු.** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.** | **ඇස්තමේන්තුගත ආදායම රු.** | **බිල්කළ ආදායම රු.** | **රැස්කළ ආදායම රු.** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.** |
| වරිපනම් හා බදු | - | - | - | - | 1,336,605 | 793,750 | 793,750 | - |
| කුලී | 8,679,389 | 13,829,873 | 8,642,335 | 5,187,538 | 5,381,574 | 8,725,969 | 4,594,805 | 4,131,164 |
| බලපත්‍ර ගාස්තු | 2,204,500 | 2,160,825 | 2,160,825 | - | 533,500 | 1,273,250 | 1,273,250 | - |
| වෙනත් ආදායම් | 10,499,288 | 46,172,843 | 41,262,441 | 4,910,402 | 9,915,739 | 19,881,350 | 3,009,516 | 16,871,834 |
| එකතුව | **21,383,177** | **62,163,541** | **52,065,601** | **10,097,940** | **17,167,418** | **30,674,319** | **9,671,321** | **21,002,998** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වර්ෂ 02 කට අධික කාලයක සිට හිඟහිටිව පවතින බදුකුලී, කුලී හා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ශේෂය රු.6,026,306ක්ව පැවතුණි. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| පොදු සංචිත ගිණුමේ වර්ෂ 05කට අධික කාලයක සිට පැවැත එන රු.7,564,999ක් මූලධන ව්‍යාපෘතිවල යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | මූලධන ව්‍යාපෘතිවල යෙදවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 පරිහරණය නොකළ දේපළ හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සංවර්ධන අරමුදලින් පුස්තකාල ප්‍රවර්ධනය සඳහා රු.1,738,800කට මිලදී ගෙන තිබුණු අයිතම එකතුව 14ක්වූ පරිගනක පද්ධති සහ ගෘහ භාණ්ඩ අදාල අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | පුස්තකාලවලට ලබාදීමට පියවර ගන්නා බව. | වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සභාව විසින් වර්ෂ 05කට අධික කාලයක සිට පරිහරණය කළ වාහන 05ක් හා අක්කර 158ක විස්තීර්ණ වූ ඉඩම් 89ක අයිතිය මේ දක්වාම පවරා ගෙන නොතිබුණි. | හිමිකාරිත්වය මාරුකිරීමට කටයුතු කරමින් පවතින බව. | සභාවට පවරා ගැනීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සභාව විසින් කසළ වෙන් වෙන් වශයෙන් වර්ග කර, රැස්කර, ප්‍රතිචක්‍රියකරණයට භාජනය කිරීමට ඵලදායී පියවර ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ කසළ බැහැර කිරීම වෙනුවෙන් එකතුව රු.2,400,050ක් ගෙවීම් කර තිබුණි. | ප්‍රතිචක්‍රීකරණය සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති බව. | විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |